# ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය නැගෙනහිර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව



# වාර්ෂික වාර්තාව - 2014

# ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ දර්ශනය වනාහි

## සෞන්දර්ය අධ්‍යයන අංශයන්හි අවශ්‍යතා සපුරන ලෙසින් ප්‍රමුබතම ආයතනයක් බවට පත්කිරීමයි.

## ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ මෙහෙවරය වනාහි

## ශ්‍රී ලංකාවේ සංස්කෘතියට ආවේනිකවූ සම්පත් සවිමත් කර ආරක්ෂා කිරීමත් තමන් තෝරා ගත් සෞන්දර්ය අධ්‍යයනය ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි දැනුම හා නිපුනතාවයන් ලබා ගැනීමට මඟ පැදිමෙන් රැකියා ලබා ගැනීමට හැකිවන පරිදි උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමත්වේ.

**කළමණාකරණය මණ්ඩලයේ සාමාජිකයන්**

සභාපති: ආචාර්ය කේ.කෝබින්දරාජා - උප කුලපති, නැගෙනහිර විශ්ව විද්‍යාලය

අධ්‍යක්ෂක: ආචාර්ය කේ.ප්‍රේමකුමාර් - ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය

පීඨාධිපති: මහාචාර්ය එම් සෙල්වරාජා - කලා හා සංස්කෘතික පීඨය, නැගෙනහිර විශ්ව විද්‍යාලය

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභා නියෝජිතවරුන් - මහාචාර්ය එස්.මෞනගුරු

ජෝසප්මේරි පියතුමා

පූජ්‍ය ශ්‍රීමත් ස්වාමි සර්වරූපානන්දජි මහරාජ්

පාලක සභා නියෝජිතවරුන් - එස්.අරුමෙයිනයගම් මහතා
එම්.එම්.මහුරූප්f කරීම් මහතා

සනාතන මණ්ඩල නියෝජිතවරු - එම්.නදීරා මිය
එස්.බාලේන්ද්‍රන් මහතා

ශාස්ත්‍රීය පාලක මණ්ඩල නියෝජිත - ආචාර්ය එස්.ජෙයසංකර්
එස්.සුබ්‍රමණියම් මෙනවිය

භාණ්ඩාගාරික නියෝජිත - එම්. රාමමූර්ති මයා

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ලේකම්) : ටී. විජයකුමාර් මයා

# වාර්ෂික වාර්තාව 2014

## 03. අධ්‍යක්ෂකගේ නිරීක්ෂණය

### 3.1 හැඳින්වීම

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, පහත සඳහන් අධ්‍යානාංශයන්ගෙන් සමන්විතව ක්‍රියාත්මකවේ.

- කර්නාටක සංගීත අධ්‍යානාංශය
- නැටුම්, නාට්‍ය හා රංගකලා අධ්‍යානාංශය
- කැටයම් හා තාක්ෂණ කලා අධ්‍යානාංශය

ආචාර්ය කේ.ප්‍රේමකුමාර් මහතා 2014 වසරේ අධ්‍යක්ෂකවරයා වූ අතර නැගෙනහිර විශ්ව විද්‍යාලයේ උපකුලපතිගේ මඟපෙන්වීම යටතේ ආයතනය මනාව ක්‍රියාත්මක විය.

### 3.2 උගන්වනු ලබන විෂයයන්

- කර්නාටක සංගීතය
- නැටුම් ( භාරත )
- නාට්‍ය හා රංග කලාව
- කැටයම් හා තාක්ෂණ කලාව

### 3.3 ව්‍යවස්ථාපිත මණ්ඩල

ශාස්ත්‍රීය පාලක මණ්ඩලය : සියළු අධ්‍යයන කටයුතු මෙහෙයවනු ලැබීය.
කළමණාකරණ මණ්ඩලය : සියළු පරිපාලන, අධ්‍යයන හා මූල්‍ය කටයුතු මෙහෙයවනු ලැබීම හා අනුමත කිරීම් සිදු කෙරුණි.

පාලක සභාව/ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය : කළමණාකරණ මණ්ඩලය/ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ රැස්වීම් වාර්තා පාලක සභාවේ තීරණය සඳහා ඉදිරිපත් කරන ලදී.

## 3.4 මුද්‍රණපමුණුවා ගැනීම්

විසිඑක් වන ශත වර්ෂය සඳහා වූ උසස් අධ්‍යාපනය (HETC) යටතේ විශ්ව විද්‍යාල සංවර්ධන ප්‍රදාන සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිගෙන පහත සඳහන් මූලික අංග හතර වැඩි දියුණු කිරීම සඳහා ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයට රුපියල් මිලියන 15 ක් ප්‍රදානය කරන ලදී.

i. තොරතුරු තාක්ෂණය වැඩි දියුණු කිරීම
ii. ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම
iii. මෘදු කුසලතා වැඩි දියුණු කිරීම
iv. සමාජ සමඟිය වැඩි දියුණු කිරීම

## 3.5 විශිෂ්ඨ සම්මාන

දෙමළ මාධ්‍ය සඳහාවූ කුෂලතා සම්මාන - **නිර්මාණාත්මක දක්ෂතා සඳහා උසස් අධ්‍යාපන සම්මාන උළෙල 2014** සඳහා දෙමළ මාධ්‍ය වෙනුවෙන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය සම්මාන 15 ක් දිනාගෙන ඇත. මේකී සම්මාන අතුරින් ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය පළමුවන ස්ථාන සඳහා සම්මාන හතරක්ද දෙවන ස්ථාන සඳහා සම්මාන 3 ක්ද හා තුන්වන ස්ථාන සඳහා සම්මාන 4 ක්ද ලබා දෙමළ මාධ්‍යයෙන් වූ කුෂලතා සම්මාන - **නිර්මාණාත්මක දක්ෂතා සඳහා උසස් අධ්‍යාපන සම්මාන උළෙල 2014 න්** දෙමළ මාධ්‍ය සමස්ත ශූරතා මතුකර ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට සහය වුණි.

## 3.6 පවත්වන ලද වැඩමුළු

| අංකය | පවත්වන ලද දිනය | වැඩමුළුවේ මාතෘකාව |
|---|---|---|
| 01 | 27.02.2014 | විශ්වවිද්‍යාලයේ නවක වදය-මානව අයිතිවාසිකම් කොමිසම් සභාව විසින් |
| 02 | 11,18,25.03.2014 | ස්වයං දැනුවත් කිරීමේ කටයුතු පිළිබඳ වැඩමුළුවක්-බ්‍රහ්ම කුමාරි රාජයෝග නිළයම්, මඩකලපුව |
| 03 | 27.06.2014 | වද දීම හා එහි බලපෑම්- මානව අයිතිවාසිකම් කොමිසම් සභාව |
| 04 | 15.08.2014-17.08.2014 | නාට්‍ය ශාස්ත්‍ර-පපුස් අධ්‍යයන හා ස්ංස්කෘතික භාරකාරය-චෙන්නායි, ඉන්දියාව |
| 05 | 07.11.2014-08.11.2014 | වේශ නිරූපනය පිළිබඳ වැඩමුළුව, චාම්වේ ජාත්‍යයන්තර කේශ අලංකාර ආයතනයේ කලාකරු විසින් |
| 06 | 14.11.2014-18.11.2014 | තෙන්මෝඩි කූත්තු පිළිබඳ වැඩමුළුව, එම්.ඥානසෙල්වම් මහතා විසින් |
| 07 | 23.11.2014-25.11.2014 | ඉගැන්වීමේ ක්‍රම හා නර්තන ප්‍රදර්ශණය - ශාන්තිනි සිවනේසන් මිය විසින් |

### 3.7 සංගීත වැඩසටහන්

| අංක | දිනය | සංගීත වැඩසටහන් පිළිබඳ විස්තර |
|---|---|---|
| 01 | 03.03.2014 | දක්ෂතා ප්‍රදර්ශණය –උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද දක්ෂතා ප්‍රදර්ශණයෙන් ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ සිසුන් සහභාගි වී නර්තනය, සංගීතය, ජන සංගීතය, කලා හා සාහිත්‍යය සඳහා තෑගි ලැබූහ. |
| 02 | 16.05.2014-12.05.20-14 | සංගීත වැඩසටහන් – සේවා ලංකා පදනම, කළුතර |
| 03 | 29.05.2014-30.05.2014 | යාපනය සංගීත උත්සවය – සේවා ලංකා පදනම |
| 04 | 15.08.2014 | බෙල්වුඩ් සෞන්දර්ය ආයතනයේ ජාතික සේවා සභාව සඳහා ජන සංගීතය පිළිබඳව සංගීත වැඩසටහන |

සමාජ සමඟිය වර්ධනය කිරීම පිණිස සංස්කෘතික වැඩ සටහන් සංවිධානය කිරීමෙහි ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය නිරත විය. සංස්කෘතික විවිධත්වය තුළින් සමාජ සමඟිය වර්ධනය කිරීමෙහිලා ශ්‍රී ලංකාව පුරා නානාවිධ සංගීත හා සංස්කෘතික වැඩ සටහන්වල අප සිසුන් සහභාගි වූහ.

### 3.8 සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම

විපුලානන්ද සෞන්දර්ය ආයතනය විසින් අපගේ ඉලක්කය උදෙසා ජන හා සාම්ප්‍රදායික කලා සංස්කෘතිය තුළින් විවිධ සංස්කෘතික වැඩසටහන් සංවිධානය කරන ලදී.

### 3.9 සංස්කෘතික වැඩ සටහන් මඟින් සමාජය තුළ අනුකූලතාවයන් ප්‍රවර්ධනය කිරීම

අපගේ සිසුන් විසින් පිළිගැනීමේ නර්තන හා අනෙකුත් සංස්කෘතික වැඩ සටහන් උසස් මට්ටමේ උත්සව මඩකලපුවේ,කච්චේරිය, බැංකු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අනෙකුත් ආයතනවල නිතර සංවිධානය කර සහභාගි වූහ.

### 3.10 ජනවාර්ගික ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ සංස්කෘතික වැඩ සටහන් සංවිධානය කිරීම

ජනවාර්ගික ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ සිසුන් සමඟ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ සිසුන් එක්ව ජන කරලිය හා ඒකාබද්ධ නාට්‍ය හා නැටුම් හා ජන ගී එනම් ඒකාබද්ධ සංස්කෘතික වැඩ සටහන් සමඟ ඒකාබද්ධ නාට්‍ය සංවිධානය කර සහභාගි වූහ.

### 3.11 අතිගරු ජනාධිපතිතුමා මඩකලපුවට පැමිණීම පිළිගැනීම

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මඩකලපුවට පැමිණෙන සෑම අවස්ථාවකදීම ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ සංස්කෘතික තූර්ය වාදක කණ්ඩායම එතුමා පිළිගැනීමට කටයුතු කර තිබේ.

**3.12** **1.** “ සරසවි මැදුර ”කාන්තා නේවාසිකාගාරය අවසන් කර 09.02.2015 දින උත්සවශ්‍රීයෙන් විවෘත කරන ලදී.

**2.** අභ්‍යයන්තර ප්‍රවේශ මාර්ග 2014 දී නිම විය.

| | **04. 31.12.2014 දිනට සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර** | | | | |
|---|---|---|---|---|---|
| දෙපාර්තමේන්තුව | අධ්‍යයන පාඨමාලාව | මුළු සිසුන් සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව |
| සංගීතය | ලලිත කලා උපාධිදාරි (සංගීතය) | 347 | 19 | 02 | |
| නැටුම් හා නාට්‍ය හා රංග කලාව | ලලිත කලා උපාධිදාරි (නැටුම්) | 212 | 07 | 02 | |
| | ලලිත කලා උපාධිදාරි (නාට්‍ය හා රංග කලාව) | 245 | 11 | | |
| කැටයම් කලාව | ලලිත කලා උපාධිදාරි (කැටයම් කලාව) | 249 | 10 | 02 | |
| පුස්තකාලය | | – | 01 | 03 | |
| පාලන | | – | – | 33 | 04 |
| මුදල් | | – | – | 04 | 01 |
| **එකතුව** | | **1053** | **48** | **46** | **05** |

| 05. 31.12.2014 දිනට දේශීය සිසුන් පිළිබඳ විස්තර | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| දෙපාර්තමේන්තුව | පාඨමාලාව | මාධ්‍යය | 2012/13 දී බඳවා ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 2011/12 දී බඳවා ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 2010/11 දී බඳවා ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 2009/10 දී ගන්නා ලද මුළු ශිෂ්‍ය | 2012 දී බඳවා ගන්නා ලද මුළු | 2012 දී උපාධිය ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
| සංගීතය | ලලිත කලා උපාධිදාරි (සංගීතය) | සිංහල | 66 | 72 | 77 | 79 | 294 | 45 |
| නැටුම් හා නාට්‍ය හා රංග කලාව | ලලිත කලා උපාධිදාරි (නැටුම්) | | 36 | 39 | 43 | 51 | 169 | 20 |
| | ලලිත කලා උපාධිදාරි (නාට්‍ය හා රංග කලාව) | | 54 | 50 | 43 | 49 | 196 | 44 |
| කැටයම් කලාව | ලලිත කලා උපාධිදාරි (කැටයම් කලාව) | | 50 | 52 | 47 | 45 | 194 | 06 |
| **එකතුව** | | | **206** | **213** | **210** | **224** | **853** | **115** |

වසරින් වසර 31.12.2014 දිනට ක්‍රමක්‍රමයෙන් සිසුන්ගේ මුළු එකතුව 853 විය. 2014 වසරේ දී සිසුන් 115 දෙනෙකු උපාධිය ලැබූහ.

| 06. 31.12.2014 දිනට පිටවූ උපාධිදාරින් පිළිබඳ විස්තර | | | | | |
|---|---|---|---|---|---|
| දෙපාර්තමේන්තුව | පාඨමාලාව | මාධ්‍යය | **2012** | **2013** | **2014** |
| සංගීතය | ලලිත කලා උපාධිදාරි (සංගීතය) | සිංහල | 45 | 19 | 30 |
| නැටුම් හා නාට්‍ය හා රංග කලාව | ලලිත කලා උපාධිදාරි (නැටුම්) | | 20 | 22 | 31 |
| | ලලිත කලා උපාධිදාරි (නාට්‍ය හා රංග කලාව) | | 44 | 46 | 39 |
| කැටයම් කලාව | ලලිත කලා උපාධිදාරි (කැටයම් කලාව) | | 06 | 33 | 45 |
| **එකතුව** | | | 115 | 120 | 145 |

වසරින් වසර ඇතුළත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව අධික වෙමින් පැවැති බැවින් උපාධිදාරීන්ගේ ගණනද ඒ අනුව වැඩිවිය.

| 07. 31.12.2014 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| දෙපාර්තමේන්තුව | පාඨමාලාව | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) | සහකාර පුස්තකාලයාධිපති | උපදේශකවරුන් |
| සංගීතය | ලලිත කලා උපාධිදාරි (සංගීතය) | ලශූ | – | – | – | – | 15 | 01 | 03 |
| නැටුම් හා නාට්‍ය හා රංග කලාව | ලලිත කලා උපාධිදාරි (නැටුම්) | | – | – | – | – | 05 | – | 02 |
| | ලලිත කලා උපාධිදාරි (නාට්‍ය හා රංග කලාව) | | – | – | 02 | – | 05 | 03 | 01 |
| කැටයම් කලාව | ලලිත කලා උපාධිදාරි (කැටයම් කලාව) | | – | – | – | – | 02 | 06 | 02 |
| පුස්තකාලය | | | – | – | – | – | 01 | – | – |
| පරිසණක ඒකකය | | | – | – | – | – | – | – | 01 |
| **එකතුව** | | | – | – | 02 | – | 28 | 10 | 08 |

මුළු අධ්‍යයන පුරප්පාඩු සංඛ්‍යාව කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය සංඛ්‍යාව අනුව අනුපාතය 18:1 ක් විය. කෙසේවෙතත් ප්‍රායෝගික මෙවලමක් සඳහා පුරප්පාඩු සංඛ්‍යවක් නිර්මාණය කළ යුතුය. ඉන් කථිකාචාර්යවරුනගේ පුරප්පාඩු සංඛ්‍යාවෙන් 6 දෙනෙකු දර්ශනසූරි (Ph D) පාඨමාලාව හදාරන අතර අනෙක් අය පශ්චාත් උපාධි පාඨමාලා හදාරති.

| 08. 31.12.2014 දිනට අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | | | | |
|---|---|---|---|---|
| **දෙපාර්තමේන්තුව** | **විධායක කාර්ය මණ්ඩලය** | **කාර්මික කාර්ය මණ්ඩලය** | **ලිපිකාර හා ඒ හා අදාළ කාර්ය මණ්ඩලය** | **සුළු සේවකයන්** |
| සංගීතය | – | – | 01 | 01 |
| නැටුම් හා නාට්‍ය හා රංග කලාව | – | – | – | 02 |
| කැටයම් හා තාක්ෂණ කලාව | – | – | – | 01 |
| පුස්තකාලය | – | – | 01 | 02 |
| මුදල් | 05 | | 03 | 01 |
| පාලන | 02 | 01+01**** | 08+01*** | 18*** |
| **එකතුව** | **05** | **02** | **14** | **25** |

වර්ෂ 2008 පසුව අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කිසිම අංශයකටවත් පුරප්පාඩු කිසිවක් බිහිකර නොමැත.
*2012 වසරේදී ගබඩා භාරකරුගේ සේවය අත්හිටුවා ඇත .
**2012 වසරේදී ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිගේ සේවය අත්හිටුවා ඇත .
*** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 25/2014 අනුව කාර්ය මණ්ඩල සේවකයන් 23 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී ඇත.

| 09. 31.12.2014 දිනට පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශණ පිළිබඳ විස්තර | | | |
|---|---|---|---|
| **විෂය** | **ප්‍රකාශණයට පත් කරන ලද** | **අලෙවි කරන ලද** | **ඉදිරිපත් කරන ලද** |
| අ. පර්යේෂණ ගණන | 14 | - | 10 |
| ආ. නවෝත්පාදන ගණන | - | - | - |
| ඇ. සඟරා ගණන | 11 | - | - |
| ඈ. පොත් ගණන | - | - | - |
| ඉ. ප්‍රවෘත්ති ලිපි | 16 | 02 | 15 |
| ඊ. වෙනත් | 01 | - | - |
| **එකතුව** | **42** | **02** | **25** |

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් බොහෝ දෙනෙකු පර්යේෂණ කටයුතුවල නිරතවී එම සියළුම පර්යේෂණ ඉදිරිපත් කරන ලදී.

| 10. 31.12.2014 දිනට වැඩ සටහන් , සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර | | | |
|---|---|---|---|
| **විෂය** | **සහභාගි වන ලද** | **නිමකරන ලද** | **ඉදිරිපත් කරන ලද** |
| අ. පශ්චාත් උපාධි පාඨමාලා ගණන | | | |
| ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා ගණන | | | |
| ඇ. උපාධි පාඨමාලා ගණන | | | |
| ඈ. ඩිප්ලෝමා පාඨමාලා ගණන | | | |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා ගණන | | | |
| ඊ. වෙනත් | 02 | 02 | - |
| **එකතුව** | **07** | **07** | **05** |

සියළුම අධ්‍යනාංශ වැඩමුළුවලට හා සම්මන්ත්‍රණවලට සහභාගි වී සිය ඉදිරිපත්කිරීම් සමඟ එය නිමාවට පත්විය.

| 11. 31.12.2014 දිනට ලබා ගත් සම්මාන පිළිබඳ විස්තර | | | |
|---|---|---|---|
| **විෂය** | **සම්මාන ගණන** | **අධ්‍යයන කාර්ය මණ්ඩල ගණන** | **ශිෂ්‍ය සංඛ්‍යාව** |
| අ. දේශීය සම්මාන | 02 | - | 17 |
| ආ.ජාතික සම්මාන | 01 | 01 | 16 |
| ඇ.ජාත්‍යයන්තර සම්මාන | 02 | - | - |
| ඈ. වෙනත් | - | 03 | 03 |
| **එකතුව** | **05** | **03** | **36** |

| 12. 31.12.2014 දිනට පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | | |
|---|---|---|
| **විෂය** | **2013**<br>**රු.** | **2014**<br>**රු.** |
| අ. පුද්ගල වේතන | 42.917,599.72 | 56,174,575.33 |
| ආ.ගමනාගමනය | 156,364.01 | 213,288.50 |
| ඇ. සැපයීම් | 2,801,251.09 | 3,301,597.44 |
| ඈ.නඩත්තුව | 1,252,750.87 | 1,981,610.31 |
| ඉ.කොන්ත්‍රාත්තු සේවා | 13,469,937.47 | 15,804,870.02 |
| ඊ.වෙනත් | 6,354,578.60 | 6,321,910.80 |
| **එකතුව** | **66,952,481.76** | **83,797,852.40** |

අනුපිළිවෙලින් නව සිසුන් ඇතුළත් කර ගැනීම ඉහළ යාමත් හා ආරක්ෂක සේවාවන් පිටින් ලබා ගැනීමත් හේතුවෙන් සැපයීම් හා කොන්ත්‍රාත්තු සේවා වියදම් වැඩි විය.

| 13. 31.12.2014 දිනට මූලධන වියදම් පිළිබඳ විස්තර | | |
|---|---|---|
| **විෂය** | **2013**<br>**රු.** | **2014**<br>**රු.** |
| අ. ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ අත්කර ගැනීම | 34,363,228.19 | 12,879,055.95 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම | - | - |
| ඇ.ගොඩනැගිලි හා සැළසුම් අත්කර ගැනීම | 236,955,779.69 | 9,631,994.42 |
| ඈ.වෙනත් | - | 17,200.00 |
| **එකතුව** | **361,319,007.88** | **22,528,250.37** |

නව සිසුන් වැඩි සංඛාවක් ඇතුළත් කර ගැනමේ පදනමක් මත භාණ්ඩ, කාර්යාල, උපකරණ හා ගොඩනැගිලි හා සැළසුම් අත්කර ගැනීමේ වියදම් වැඩි වූ අතර 2014 වසරේ පහත වැටීමක් සිදු විය.

| 14. 31.12.2014 දිනට ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය /විදේශීය ආධාර) | | | | | |
|---|---|---|---|---|---|
| **නම හා විස්තර** | **ණය /ප්‍රදාන** | **ණය ලබාදුන් ආයතනය** | **TCE රු.** | **RFA රු.** | **DF රු.** |
| HETC ව්‍යාපෘතිය | ප්‍රදාන | ලෝක බැංකුව | 15 මිලියන | | |
| එකතුව | | | 15 මිලියන | | |

තොරතුරු තාක්ෂණ කුසලතා, ඉංග්‍රීසි ,මෘදු කුසලතා හා සමාජ සමඟිය වැඩි දියුණු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා වෙනුවෙන් HETC-UDG යටතේ HETC ලෝක බැංකුව මඟින් මිලියන 15 ක් ප්‍රදානය කරන ලද අතර සියළු මුදල් උපයෝගි කරගන්නා ලදී.

| 15. 31.12.2014 දිනට ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය /විදේශීය ආධාර) | | | | | |
|---|---|---|---|---|---|
| **නම** | **TCE රු.** | **2013 දී වියදම් රු.** | **2014 දී වියදම් රු.** | **31 12 2014 දිනට සමුච්චිත වියදම් රු.** | **භෞතික ප්‍රගතිය %** |
| HETC ව්‍යාපෘතිය | 15 මිලියන | - | - | - | - |
| **එකතුව** | 15 මිලියන | - | - | - | |

| 16. 31.12.2014 දිනට මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම් ) | | | |
|---|---|---|---|
| **විෂයය** | **2014 දී වෙන්කිරීම්** | **2014 දී වියදම** | **ඉතිරිකිරීම්/වැඩිවීම්** |
| අ. පුනරුත්ථාපන වියදම් ව්‍යාපෘති | 74,000,000.00 | 93,807,314.02 | (16,919,351.90) |
| ආ. මූලධන වියදම් ව්‍යාපෘති | 45,000,000.00 | 22,528,250.37 | 22,471,749.63 |
| ඇ. ව්‍යාපෘති - දේශීය ආධාර | - | - | - |
| ඈ. ව්‍යාපෘති- විදේශීය ආධාර | - | - | - |
| **එකතුව** | **119,000,000.00** | **116,335,564.39** | **5,552,397.73** |

| 17. 31.12.2014 දිනට මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ආදායම් ) | | | |
|---|---|---|---|
| **ආදායම් මාර්ග** | **2013 දී වෙන්කිරීම්** | **2013 දී ලැබීම්** | **ඌණතා /අතිරික්ත** |
| උපාධි පාඨමාලා | 1,250,000.00 | 2,799,274.62 | 1,549,274.62 |
| පශ්චාත් උපාධි පාඨමාලා | – | – | – |
| උපදේශණ සේවා | – | – | – |
| වෙනත් | 20,000.00 | 88,687.50 | 68,687.50 |
| **එකතුව** | **1,270,000.00** | **2,877,961.12** | **2,617,962.12** |

| 18. 31.12.2014ට මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය | | |
|---|---|---|
| **විෂයය** | **සූත්‍රය** | **එක් සිසුවෙකු සඳහා වියදම රු.** |
| අ. එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම් (පුවි) | පුනරාවර්තන වියදම්/ සිසුන් ගණන | 98,238.98 |
| ආ. එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම් (ප්‍රාවි) | ප්‍රාග්ධන වියදම්/ සිසුන් ගණන | 26,410.61 |
| **එකතුව** | | **124,649.59** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊඑන්/බීටී/බී/එස්වීඅයිඒඑස් /01/14/05
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2015 සැප්තැම්බර් 18 දින

අධ්‍යක්ෂ,

සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනය

**සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්ව විද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩ තහනම් කළ හෝ සේවයෙන් පහ කළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.573,338 ක් වූ සේවක ණය ශේෂ වර්ෂ 03 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද එම හිඟ ශේෂයන් විගණන දිනය වූ 2015 ජූනි 30, දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ආ) නිලධාරීන් 04 දෙනෙකුට ගෙවන ලද එකතුව රු.14,393 ක් වූ වැටුප් අත්තිකාරම් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 03 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඇ) රු.1,652,862 ක මුදලක් නිරවුල් කිරීමට හෝ ගිණුම් පොත් වලින් කපා හැරීමට ඵලදායී පියවර ගැනීමෙන් තොරව ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයට ගෙවිය යුතු මුදලක් ලෙස වර්ෂ 10 කට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2012 හා 2013 වර්ෂ සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන හා ඒ සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තා 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 109 වගන්තිය ප්‍රකාරව 2015 අප්‍රේල් 24 දක්වා රජයේ ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව කාර්ය මණ්ඩලයට දෙනු ලැබූ අත්තිකාරම් එය දෙන ලද කාර්යය නිම කළ වහාම නිරවුල් කළ යුතුය. කෙසේ වුවද අවස්ථා 6 කදී දෙනු ලැබූ එකතුව රු.383,420 ක් වූ අත්තිකාරම් මාස 04 සිට මාස 07 දක්වා කාලයක ප්‍රමාදයකින් පසු නිරවුල් කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

Converted by PDF to JPG
http://www.PDF-Helper.com/pdf-to-jpg/

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම සඳහා වූ රු.74,000,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.90,919,352 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම සඳහා වූ රු.68,364,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර එම වර්ෂයේ ඌනතාවය රු.70,750,664 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.20,168,688 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. පෙර වර්ෂයට සාපේක්ෂව රු.13,256,976 කින් පුද්ගලික පඩිනඩි වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි වේ.



17

(අ) විභාග ප්‍රතිඵල

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද අවසන් විභාග විස්තර හා විභාග වලින් සමත්වූ ශිෂ්‍යයින් සංඛ්‍යාව පහත දැක්වේ.

| විස්තරය | සංගීත පීඨය | | නර්තන පීඨය | | නාට්‍ය හා රඟුම් පීඨය | | දෘශ්‍ය හා තාක්ෂණික කලා පීඨය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2013 | 2014 | 2013 | 2014 | 2013 | 2014 | 2013 |
| සමාලෝචිත වර්ෂය තුළ අවසාන විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 38 | 26 | 29 | 25 | 39 | 50 | 46 | 43 |
| විභාගවලින් සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 23 | 19 | 27 | 22 | 38 | 46 | 32 | 33 |
| විභාග වලට පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස විභාගවලින් සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 61 | 73 | 93 | 88 | 97 | 92 | 70 | 77 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

සංගීත පීඨයේ සහ දෘශ්‍ය හා තාක්ෂණික කලා පීඨයේ අවසන් විභාග වලට පෙනී සිටි පිළිවෙලින් සිසුන් 38 දෙනෙකුගෙන් හා සිසුන් 46 දෙනෙකුගෙන් සිසුන් 15 දෙනෙකු හා 14 දෙනෙකු විභාග අසමත්වී තිබූ අතර එය අවසන් විභාග වලට පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 39 ක් හා සියයට 30 ක් නියෝජනය විය.



18

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

(අ) රු.2,119,360 ක මුළු පිරිවැයකට 2013 වර්ෂයේදී තට්ටු ඇඳන් (Bank Beds) 45 ක් ආයතනය විසින් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද මෙම ඇඳන් කුලී පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිල්ලෙහි 2015 ජූලි 31 දක්වා නිෂ්කාර්යව පැවතුණි.

(ආ) මුළු පිරිවැය රු.190,000 කට මිලදී ගත් පරිගණක දෙකක් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව ඒවා මිලදී ගත් 2014 සැප්තැම්බර් 18, දින සිට ගබඩාවේ තබා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 7 කදී ආයතනයේ නිලධාරින් තිදෙනෙකුට ගෙවන ලද එකතුව රු.300,080 ක් වූ අත්තිකාරම් අදාළ නිලධාරින් විසින් 2015 ජූලි 31 දක්වාත් නිරවුල් කර නොතිබුණි.

(ඈ) නර්තන පීඨයේ ගබඩාවේ සිදුකරන ලද භෞතික තොග සමීක්ෂණයේදී රු.920,621 ක් වටිනා ගබඩා විෂයයන් 38 ක තොග ඌනතාවයක් අනාවරණය විය. කෙසේ වුවද එම විෂයයන් නැතිවීම පිළිබඳව වගකිව යුතු නිලධාරින්ට එරෙහිව විධිමත් පියවරක් ආයතනය විසින් ගෙන නොතිබුණි.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අධ්‍යයන | 38 | 36 | 02 | - |
| අධ්‍යයන සහාය | 07 | 01 | 06 | - |
| විධායක | 05 | 03 | 02 | - |
| ලිපිකරු හා සමාන්තර | 16 | 10 | 06 | - |
| කනිෂ්ඨ | 07 | 27 | - | 20 |
| එකතුව | 73 | 77 | 16 | 20 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුර හා ගබඩා භාරකරු තනතුර 2012 ජුලි 02 සිට පුරප්පාඩු වී පැවතුණි. මේ අතර එම තනතුරු සඳහා සුදුසු නිලධාරීන් පත් කිරීමට කටයුතු කිරීමෙන් තොරව නැගෙනහිර විශ්ව විද්‍යාලයේ නිලධාරීන් එම තනතුරු දෙක සඳහා වැඩ බැලීමේ පදනම මත රාජකාරී සිදුකර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ වැඩ බැලීමේ දීමනා ලෙස රු.101,719 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) කනිෂ්ඨ සේවකයින් සඳහා අනුමත සේවක සංඛ්‍යාව 07 ක් වූ නමුත් ආයතනය විසින් සේවකයන් 20 දෙනෙකු අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවා ගෙන තිබුණි. තවද මෙම අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා අදාළ අධිකාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය ආයතනය විසින් ලබාගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 20 සිට සියයට 2,524 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ප්‍රසම්පාදනය

(ඇ) අත්තිකාරම් ගෙවීම

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)